# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | දුරකථන / தொலைபேசி / Telephone: +94 11 2484600, +94 11 2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax: +94 11 2484970, +94 11 2320042 | වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No.: TO/GR/Miscellaneous | ඔබේ අංකය / உமது இல / Your Number: | දිනය / திகதி / Date: 2022.03.21 |

විශේෂ අවධානය:- දැනට ITMIS ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ආයතනවල ප්‍රධාන මූල්‍ය නිළධාරී/ප්‍රධාන ගණකාධිකාරී

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**විදේශාධාර ප්‍රදාන සඳහා අක්මුදල් ඉල්ලුම් කිරීම**

විදේශාධාර ගිණුම් තැබීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 30/94 හා 1994 අප්‍රේල් 20 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි.

02. ඒ අනුව, විදේශාධාර ප්‍රදාන සඳහා ලැබෙන සියළුම මුදල් ප්‍රථමයෙන්ම භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නිල බැංකු ගිණුමට බැරවනු පිණිස මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කලයුතු අතර ඉන්පසුව ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමෙන් අනතුරුව නියමිත අක්මුදල් මෙම දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කල යුතු වේ. මෙලෙස ප්‍රදාන සඳහා අක්මුදල් ඉල්ලුම් කිරීමේදී ඇතැම් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් එම අක්මුදල් දැනටමත් හඳුන්වාදී ඇති ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් තොරතුරු පද්ධතිය (ITMIS) පද්ධතිය හරහා ඉල්ලුම් කරනු ලබන බව නිරීක්ෂණය විය.

03. එබැවින්, ඔබ විසින් විදේශාධාර ප්‍රදාන උපයෝජනය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන යටතේ අක්මුදල් ඉල්ලුම් කිරීමේදී, එම අක්මුදල් දැනට හඳුන්වාදී ඇති ITMIS පද්ධතිය හරහා ඉල්ලුම් කිරීමට කටයුතු නොකරන ලෙස මෙයින් ඔබට කාරුණිකව දන්වා සිටිමි. ඒ වෙනුවට, විදේශාධාර ප්‍රදාන සඳහා අක්මුදල් ඉල්ලුම් කිරීමේදී, ප්‍රදානකරු, ව්‍යාපෘතියේ නම සහ අදාල වැය සංකේතාංකය ඇතුලත් කරන ලද ඔබගේ අයදුම්පත මෙම දෙපාර්තමේන්තුවේ විදේශ ප්‍රදාන අංශය වෙත ලිඛිතව ඉදිරිපත් කර අක්මුදල් ලබා ගැනීමට කටයුතු කරන ලෙස මෙයින් වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

04. ඉහත පරිදි මෙම දෙපාර්තමේන්තුව වෙතින් අවශ්‍ය අක්මුදල් ලබා ගත් පසුව පමණක් එම මුදල ITMIS පද්ධතියට ඇතුලත් කර වියදම් දැරීමට අවශ්‍ය පියවර ගත යුතු වේ.

05. දැනට හඳුන්වා දී ඇති ITMIS පද්ධතිය ඉදිරියේදී සම්පූර්ණයෙන් ක්‍රියාවට නැගීමෙන් පසුව ඉහත සඳහන් ක්‍රියාවලියේ වෙනසක් සිදුවන්නේ නම් නැවත අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

එච්.සී.ඩී.එල්. සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- (i) අධ්‍යක්ෂ ජනරාල්, තොරතුරු තාක්ෂණ කළමණාකරණ දෙපාර්තමේන්තුව - කරු. දැන ගැනීම සඳහා

(ii) අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව - කරු. දැන ගැනීම සඳහා